INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

**මාධ්‍ය නිවේදනය: ශ්‍රී ලංකාවේ නව හමුදා මාණ්ඩලික ප්‍රධානියා ට එරෙහිව යුද අපරාධ නඩු පැවරීමට ප්‍රමාණවත් සාක්ෂි ඇත.**

W ITJPSL.COM
E ITJPSL@GMAIL.COM

EXECUTIVE DIRECTOR:
YASMIN SOOKA

2019 ජනවාරි 29

**ජොහැන්නස්බර්ග්:** ශ්‍රී ලංකා යුද හමුදාවේ නව මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වාට යුද අපරාධ සහ මානව වර්ගයාට එරෙහි අපරාධ සම්බන්ධයෙන් නඩු පැවරීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි තිබෙන බව ශ්‍රී ලංකාවේ සත්‍යය හා යුක්තිය සඳහා වන ජාත්‍යන්තර ව්‍යාපෘතිය (ITJP) පවසයි. දකුණු අප්‍රිකාව පදනම් කරගත් එම ගවේෂණාත්මක කණ්ඩායම 2008-9 යුද්ධ භූමියේ ඉතාමත් වැදගත් අණදෙන නිලධාරියකු මේජර් ජනරාල් සිල්වා කළ කාර්ය භාරය විස්තර කරමින් පිටු 137 ක තොරතුරු ගොනුවක් සම්පාදනය කර තිබේ. ඔහුට - හෝ යුද සමයේ කවර අණ දෙන නිලධාරියකුට හෝ - එරෙහිව මෙතාක් සම්පාදනය කරන ලද වඩාත් සවිස්තරාත්මක සාක්ෂි සම්පිණ්ඩනය එය වෙයි. අභ්‍යන්තර පුද්ගලයන් විසින්ද සපයන ලද ඡායාරූප, අදාළ සමයේ කෙටි ජංගම පණිවිඩ සහ සාක්ෂි වාචක මෙන්ම, සත්‍යය වසන් කිරීමේ අරමුණින් යුතුව පසු කලෙක අන්තර්ජාලයෙන් ඉවත් කරගන්නා ලද නිල හමුදා නිවේදන සහ එක්සත් ජාතීන්ගේ විමර්ශන වාර්තා වලින් සොයාගන්නා ලද කරුණු ද එහි ඇතුලත් වේ.

*"මගේ කණ්ඩායම විසින් වසර ගණනාවක් තිස්සේ මහත් සුපරීක්ෂාවෙන් එකතු කරගන්නා ලද සාක්ෂි මහත් සම්භාරයක් මේ තොරතුරු ගොනුවට ඇතුලත් වෙයි,"* යනුවෙන් ITJP විධායක අධ්‍යක්ෂිකා යැස්මින් සූකා පැවසුවාය. *"ජාත්‍යන්තර විනිශ්චය සභා හෝ ජාත්‍යන්තර අපරාධ අධිකරණය විසින් සාර්ථක ලෙස අවසන් කරන ලද බොහෝ නඩු කටයුතු වලට ලැබී තිබුනේ මීට අඩු තොරතුරු ප්‍රමාණයකි. ශ්‍රී ලංකා යුද හමුදාවේ දෙවැනියා ලෙස තව දුරටත් කටයුතු කිරීම සඳහා මේ පුද්ගලයාට දැන් කිසිදු නිදහසට කරුණක් නැත. වහාම ඔහුගේ වැඩ තහනම් කොට අපරාධ විභාගයක් ආරම්භ කළ යුතුය."*

යැස්මින් සූකා යනු ශ්‍රී ලංකාවේ අවසන් යුද්ධයේ ක්‍රියා කලාපය විමසා බැලීම සඳහා එක්සත් ජාතීන්ගේ මහලේකම් වරයා විසින් 2010 දී පත් කරන ලද ජාත්‍යන්තර නීති විශාරදයන් තිදෙනා අතරින් එක් තැනැත්තියකි. ශ්‍රී ලංකාවේ දී එක්සත් ජාතීන් විසින් කරන ලද බරපතල වැරදි සම්බන්ධයෙන් ඉන් අනතුරුව 2012 දී අභ්‍යන්තර විමර්ශනයක්ද, ඉන්පසු මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස් කාර්යාලයේ පරීක්ෂණයක්ද පවත්වන ලදී.

*"එක්සත් ජාතීන්ගේ විමර්ශනයේ කටයුතු 2015 දී අවසන් වූ පසුවත්, යුද්ධය හා සම්බන්ධ සාක්ෂි ලේඛනගත කිරීම සහ එකතු කිරීම ITJP විසින් දිගටම කරගෙන යන ලදී. මෙයින් අදහස් වන්නේ සිවිල් යුද්ධයේ අවසාන අදියරේ සහ ඉන් අනතුරුව සිදුකරන ලද උල්ලංඝන වලට අදාළ සාක්ෂි රැගත් සුවිශාලම ලේඛනාගාරය ඇත්තේ අපේ රාජ්‍ය නොවන සංවිධානය සතුව බවයි. මේ ගොනුව අප සතුව ඇති තොරතුරු වලින් අල්ප මාත්‍රයක් පමණකි,"* යි සූකා මහත්මිය පැවසුවාය. *"මෙම කටයුත්ත කිරීම සඳහා වසර*

*ගණනාවක් තිස්සේ ගොඩ නගාගත් දැනුවත් භාවයෙන් යුත් විශේෂඥ කණ්ඩායමක් කැපවීමේ වැදගත් කම එමගින් විදහා දැක්වෙයි."*

ප්‍රතිසංස්කරණ පොරොන්දු වෙමින් 2015 දී බලයට පත් ශ්‍රී ලංකාවේ අලුත් ආණ්ඩුව දෙමුහුන් අධිකරණයක් ද ඇතුලත් මහත් අපේක්ෂාවෙන් යුත් සංක්‍රාන්ති යුක්ති ක්‍රියාදාමයකට සහාය දෙන එක්සත් ජාතීන්ගේ යෝජනාවකට සම අනුග්‍රහය දක්වා පසුව එය ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේප කළේය. අතීතය සම්බන්ධයෙන් පියවර ගන්නා බවට පොරොන්දු දී තිබුනත්, දශකයකට ඉහත අවසන් වූ යුද්ධයේ කළ කාර්යභාරය සම්බන්ධයෙන් කිසිදු ඉහළ හමුදා නිලධාරියකුට දඬුවම් පමුණුවා නැත. ඒ වෙනුවට සිදු කර ඇත්තේ චූදිත අපරාධකරුවන් කිහිප දෙනකුටම උසස් වීම් ලබා දීමයි.

ඒ අතරින් වඩාත් දරුණු කටයුත්ත වූයේ 2019 ජනවාරියේදී ශවේන්ද්‍ර සිල්වා යුද හමුදා මාණ්ඩලික ප්‍රධානී තනතුරට උසස් කිරීමයි. එය යුද්ධයෙන් ජීවිත බේරාගත් දෙමළ ජනතාව ජීවත් වන ප්‍රදේශ වල සන්ත්‍රාසයක් සහ තැති ගැන්මක් ජනිත කළේය. දකුණේ ඇතැමුන්ට නම්, ඔහු තවමත් රණවිරුවෙකි.

*"ශවේන්ද්‍ර සිල්වා දණ්ඩ මුක්තිය භුක්ති විඳින තාක් කල්, නීතියේ ආධිපත්‍යය සහ වගවීම අත් කරගෙන ඇති ප්‍රගතිය ගැන කතා කිරීමේ හැකියාවක් ජාත්‍යන්තර ප්‍රජාවට නැත . මේ පුද්ගලයා යුද හමුදාව පාලනය කරන කල එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් දෙපාර්තමේන්තුව තවදුරටත් ශ්‍රී ලංකාවෙන් භට පිරිස් බඳවා ගන්නේ කෙසේද? එය බරපතලම ජාත්‍යන්තර අපරාධ වලට දෙන සමාවක් වනු ඇත. ශ්‍රී ලංකාව පියවර නොගන්නේ නම්, විශේෂයෙන් ශ්‍රී ලංකාව සමග සමීප හමුදා සම්බන්ධතා පවත්වන කලාපයේ රටවල් කරා අප යොමු වන්නේ ශවේන්ද්‍ර සිල්වාට වීසා ලබා නොදෙන ලෙස, ඊටත් වඩා ජාත්‍යන්තර යුක්ති විනිශ්චය යටතේ ඔහුට නඩු පවරන ලෙස ඉල්ලා සිටීමටයි," යනුවෙන් සූකා මහත්මිය වැඩිදුරටත් කියා සිටියාය.*

ශවේන්ද්‍ර සිල්වාගේ ඊළඟ ඉහල නිලධාරියා ව සිටි, ලතින් ඇමරිකාවේ තානාපතිවරයකු වූ ජනරාල් ජගත් ජයසූරියට එරෙහිව ITJP විසින් ජාත්‍යන්තර යුක්ති විනිශ්චය යටතේ 2017 දී යුද අපරාධ නඩු මාලාවක් පවරන ලදී. නඩු පැවරීම සමගම පලා ගිය ජනරාල් ජයසූරිය ආපසු චිලියට හෝ බ්‍රසීලයට පැමිණ තමන්ට එරෙහි චෝදනා ස්වාධීන අධිකරණයක පරීක්ෂාවට ලක් කරගන්නා බවක් පෙනෙන්නට නැත.

**තොරතුරු ගොනුවේ සාරාංශය**

ශවේන්ද්‍ර සිල්වාගේ අණ යටතේ පැවති 58 වැනි සේනාංකය 2008-9 වකවානුවේ ශ්‍රී ලංකාවේ උතුරේ ගම් හා නගර ගණනාවකට එල්ල කළ ප්‍රහාර පිලිබඳ විස්තර මෙම තොරතුරු ගොනුවේ දැක්වෙයි. එයින් ප්‍රකාශ කෙරෙන පරිදි එම ප්‍රහාර වලට මේවාද ඇතුලත් වෙයි.

- වගවිභාගයකින් තොරව සාමාන්‍ය ජනතාවට එරෙහිව හිතාමතා එල්ල කළ ප්‍රහාර
- රෝහල් සහ වෛද්‍ය කාර්ය මණ්ඩල වලට ප්‍රහාර
- යුද මුක්ත කලාප වලට ප්‍රහාර
- තහනම් සහ වගවිභාගයකින් තොර ආයුධ යොදාගැනීම

**විධාන වගකීම**

ජාත්‍යන්තර නීතිය යටතේ ශවේන්ද්‍ර සිල්වා වැනි අණ දෙන නිලධාරියකු පහත දැක්වෙන කටයුතු සම්බන්ධයෙන් සෘජු වගකීමෙන් බැඳේ:

- නීතිවිරෝධී ක්‍රියාමාර්ග ගන්නා ලෙස තමන් යටතේ ඉන්නා කාර්ය මණ්ඩලයට අණ කිරීම
- ඔහු යටතේ සිටින්නන් නීතිවිරෝධී ක්‍රියා සිදු කරන විට ඊට එරෙහිව පියවර නොගැනීම (ඔහු ඊට අණ දුන්නේද යන්න නොසැලකේ).
-

මේජර් ජෙනරාල් සිල්වා සොල්දාදුවන්ට මානුෂීය නීතිය උගන්වන බව යුද හමුදාව පවසන හෙයින්, ඔහු මේ පිළිබඳව දැන සිටිය යුතුය.

**සාමාන්‍ය වැසියන්ට පහර දීම**

තොරතුරු ගොනුවේ සොයාගැනීම් අනුව සාමාන්‍ය ජනතාවට සිදුවූ මරණ සහ තුවාල ව්‍යසනයකට අඩු දෙයක් ලෙස කිසිසේත් සැලකිය නොහැකිය. හෙළිවී ඇති දහස් සංඛ්‍යාත ඡායාරූප වලින් පැහැදිලිවම පෙන්නුම් කෙරෙන්නේ මෙය සාමාන්‍ය ජනතාවට එරෙහිව දියත් කෙරුනු යුද්ධයක් බවයි. ආණ්ඩුවේ

නිරන්තර ෂෙල් ප්‍රහාරවලට ගොදුරුවූ අටවාගත් රෝහල්වල තිබූ මහත් බියජනක තත්වය ඇසින් දුටු සාක්ෂිකරුවන් විසින් විස්තර කර තිබේ:

"එතන වචනවලින් කියන්න බැරි තරමේ මහා අවුල් ජාලයක්. අඬන, වැලපෙන දෙමාපියෝ තුවාල වෙච්ච් දරුවන් උස්සගෙන බයේ එහාට මෙහාට දුවනවා. දරුවන්ට හොඳටම තුවාල වෙලා, සමහරුන්ගේ බාගෙට ගැලවෙච්ච් අතපය ඇඟෙන් එල්ලෙනවා."

දශකයක් ගතවීත් හොල්මන් කරන පන අදින්නන්ගේ දර්ශන නිසා 2009 යුද්ධයෙන් දිවි ගලවා ගත් දෙමළ ජනතාව මහත් බියෙන් හා චිත්ත කම්පනයෙන් පීඩා විඳිමින් සිටිති. ළදරුවකුගේ හිසක් තමන් අසල පතිත වූ අයුරු එක් අයකු විස්තර කළේය. තවෙකකුගේ මතකයෙහි ඇත්තේ එල්ලා හැලෙන බොකු බඩවැල් අතින් අල්ලාගෙන සිටින මිනිසකු පසු කරගෙන ගිය ආකාරයයි. ආරක්ෂාව සඳහා අගල් හාරන්නට ගත් සමහරුන්ට දිගටම හමුවී ඇත්තේ කුණුවී යන මල සිරුරුය. ලේ පිරී වලවල් පාගමින් දිවගිය ආකාරය ගැන තවත් අය කියා තිබේ. තම ආදරණීයයන් මරුමුවට පත්වී ඇතැයි යන අවබෝධයෙන් තොර සමහරුන් විසින් ඔවුන් ආරක්ෂිත ස්ථාන වලට ඔසවා ගෙන යනු දුටු අයුරු ඔවුන් බොහෝ අවස්ථා වල විස්තර කර තිබේ. බියජනක දර්ශන සිතට කාවැදී ඇති යුද්ධයෙන් දිවි ගලවාගත්තවුන් බොහොමයක් යුද්ධයෙන් පසු කාල පරිච්ඡේදයේදී වධබන්ධනයට සහ ලිංගික ප්‍රචණ්ඩතාවට ගොදුරු වූවෝ ද වෙති.

"එක පවුලක දහඅට මාසෙක විතර දරුවයි එයාගේ තාත්තයි ඇරෙන්න පවුලේ හැමෝම මැරුනා. දෙන්නගෙම ඔලුව තුවාල වෙලා දරුවා හරිම බඩගින්නෙන්. එයාගේ ඔලුවෙන් ලේ වැක්කෙරෙනවා. මං හිතන්නේ එයාට වටපිට සිද්ධ වෙන දේ ගැන තේරුමක් නැතිව, ලේ ගැනවත් ඔලුවේ තුවාලේ ගැනවත් වගක් නැතිව, ඔහේ ඇඟිල්ල උර උරා හිටියේ ඒ තරමටම බඩගිනි හින්දයි."

**කිලිනොච්චි ප්‍රහාර**

කිලිනොච්චියට දිගින් දිගටම ප්‍රහාර එල්ල කරන විටත්, එය අල්ලා ගන්නා විටත්, අණ දීමෙහි යෙදී සිටියේ මේජර් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ය. සාමාන්‍ය වැසියන්ට හානි පමුණුවමින් රෝහල් සහ එක්සත් ජාතීන්ගේ ගොඩනැගිලි වැනි සිවිල් ස්ථාන වලට පහර දීමේ උවමනාවෙන් යුතුව ප්‍රහාර එල්ල කිරීමට ශවේන්ද්‍ර සිල්වා අණදුන් බව විශ්වාස කළ හැකි සාධාරණ හේතු කාරණා තිබේ.

**පුදුකුඩියිරුප්පු ප්‍රහාර**

ශවේන්ද්‍ර සිල්වාගේ නායකත්වයෙන් දියත් කෙරුනු පුදුකුඩියිරුප්පු හමුදා මෙහෙයුමට 58 සේනාංකය සෘජුවම සම්බන්ධ විය. රජයට චන්ද්‍රිකා දත්ත සන්නිවේදනය කර තිබූ නිසා ආරෝග්‍යශාලාව පිහිටි ස්ථානය පිළිබඳව ඔහු දැනුවත්ව සිටි අතර, ඩ්‍රෝන් සහ නියමුවන් රහිත ගුවන් යානා විසින් ඒ පළාත සෝදිසියට ලක් කෙරිනි. රෝහල ප්‍රහාරයට ලක් වෙමින් පවතින බව එජා නිලධාරීන් විසින් ශ්‍රී ලංකා යුද හමුදාවට කිහිප වාරයක් දැනුම් දී තිබුනු නිසා පුදුකුඩියිරුප්පු රෝහල බෝම්බ සහ ෂෙල් ප්‍රහාරයට ගොදුරු වී තිබෙන බවට මේජර් ජෙනරාල් සිල්වා ට මනා අවබෝධයක් තිබුණු බව විශ්වාස කළ හැකි සාධාරණ හේතු කාරණා පවතී. තමන්ගේ පාලනය යටතේ සේවය කළ'වුන් බහුතරයක් සාමාන්‍ය වැසියන් සිටි ප්‍රදේශවල ජාත්‍යන්තර හා මානුෂවාදී නීතිය බරපතල ලෙස කෙළෙසමින් සිටින බව දැන සිටි හෝ දැනගත යුතුව සිටි මේජර් ජෙනරාල් සිල්වා, තමන් සතුව විධාන වගකීම සහ බලය තිබුනත්, ඒවා නවතා ලන්නට කටයුතු කළේ නැත.

**පොක්කනෙයි ප්‍රහාර**

ශවේන්ද්‍ර සිල්වාගේ විධානය යටතේ වූ භට සේනා විසින් පොක්කනෙයිහි හමුදා මෙහෙයුම් සිදු කරන විටදී, කිරි බෙදාහරින ස්ථාන ඇතුළු සාමාන්‍ය වැසියන් සිටි තැන් වලට වගවිභාගයකින් තොර ප්‍රහාර හිතාමතාම එල්ල කරන ලදී. එයින් සාමාන්‍ය වැසියන්ට බරපතල හානි සිදුවූ අතර කාන්තාවන් හා ළමුන් ට තුවාල සිදුවී මරණයට පත් විය.

සාමාන්‍ය වැසියන්ට තුවාල සිදු කරමින්, ඔවුන් මරණයට පත් කරමින්, තමන් යටතේ සිටියවුන් සාමාන්‍ය වැසියන් ගහන පළාත් වලට හිතාමතා ප්‍රහාර එල්ල කළ බව මෙන්ම, වගවිභාගයෙන් තොර ප්‍රහාර දියත් කළ බව මේජර් ජෙනරාල් සිල්වා දැන සිටි බව හෝ දැන සිටීමට හැකියාව තිබූ බව විශ්වාස කළ හැකි සාධාරණ හේතු කාරණා පවතී. එම ප්‍රහාර දීර්ඝ කාල පරිච්ඡේදයක් තිස්සේ සිදු කෙරුනු අතර කලින් ප්‍රහාර පිලිබඳ තොරතුරු ඔහුට ලැබී තිබෙන්නට ඇත.

**පුදුමාතලන් ප්‍රහාර**

පුදුමාතලන් රෝහලට එරෙහි හමුදා මෙහෙයුම මේජර් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වාගේ නායකත්වයෙන් සිදුවූ බවත්, ඔහුගේ විධානය යටතේ වූ හට සේනා එම රෝහල අල්ලා ගත් බවත් මේ වාර්තාවේ එන තොරතුරු වලින් තහවුරු වෙයි. රෝහල තුලත් ඉන් පිටතත් සාමාන්‍ය වැසියන්ට බරපතල හානි පමුණුවමින්, රෝහලද ඇතුලත් පුදුමාතලන් ප්‍රහාර සැලසුම් කොට ඊට අණ දුන්නේ මේජර් ජෙනරාල් සිල්වා බව විශ්වාස කිරීමට සාධාරණ හේතු කාරණා පවතී. රෝහල කිහිප වාරයක්ම ප්‍රහාර වලට ගොදුරු වූ හෙයින්, මේජර් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා එම ප්‍රහාර සඳහා අණ දුන්නේ සිවිල් සම්පත් වලට පහර දීමේ අරමුණින් යුතුව බව විශ්වාස කළ හැකි සාධාරණ හේතු කාරණා පවතී.

**වලයිඥර්මඩම් (වලයන්මඩම්) ප්‍රහාර**

සාමාන්‍ය වැසියන්ට හානි පමුණුවමින් ගොඩනැගිලි කඩා බිඳ දමමින් වලයිඥර්මඩම් රෝහලටත්, දේවස්ථානයටත් එල්ල කළ ප්‍රහාර වලට ශවේන්ද්‍ර සිල්වාගේ හට පිරිස් සම්බන්ධ බවට විශ්වාස කළ හැකි සාධාරණ හේතු කාරණා පවතී. එහිදී 58 සේනාංකය ඇතුළුව ශ්‍රී ලංකා යුද හමුදාව විසින් ෂෙල් වෙඩි, යුද ටැංකි හා පොකුරු වෙඩි යොදා ගන්නා ලදී. එයින් පෙන්නුම් කෙරෙන්නේ වගවිභාගයකින් තොර යුද්ධෝපක්‍රම යොදාගත් ආකාරයයි. තමන් යටතේ සිටියවුන් වලයිඥර්මඩම් හි සාමාන්‍ය ජනතාවට සහ සිවිල් සම්පත් වලට හිතාමතා ප්‍රහාර එල්ල කළ බව මෙන්ම සාමාන්‍ය වැසියන්ට බරපතල ලෙස මරණ සහ තුවාල සිදුකිරීමට හේතුවිය හැකි වගවිභාගයෙන් තොර ප්‍රහාර දියත් කළ බව මේජර් ජෙනරාල් සිල්වා දැන සිටීමට හැකියාව තිබූ බව විශ්වාස කළ හැකි සාධාරණ හේතු කාරණා පවතී.

**මුල්ලිවයික්කාල් ප්‍රහාර**

තමන් යටතේ සිටියවුන් මුල්ලිවයික්කාල් හි සාමාන්‍ය ජනතාවට සහ සිවිල් සම්පත් වලට හිතාමතා ප්‍රහාර එල්ල කළ බව මෙන්ම සාමන්‍ය වැසියන්ට බරපතල ලෙස මරණ සහ තුවාල සිදුකිරීමට හේතුවිය හැකි වගවිභාගයෙන් තොර ප්‍රහාර දියත් කළ බව මේජර් ජෙනරාල් සිල්වා දැන සිටි බව හෝ දැන සිටීමේ හැකියාව තිබූ බව හෝ විශ්වාස කළ හැකි සාධාරණ හේතු කාරණා පවතී. තවදුරටත් ගත් කල, "පුද්ගලිකව භූමියේ හමුදා මෙහෙයවූ" ඔහු එම ප්‍රදේශයේ සිටි බවත්, එමනිසාම උන්හිටි තැන් අහිමිවූ සාමාන්‍ය වැසියන් ප්‍රහාර වලට ගොදුරු වූ ආකාරය දැකගන්නට ඇති බවත් සාක්ෂි වලින් දැක්වේ. මන්ද, තුන්වැනි යුද මුක්ත කලාපයේ ප්‍රමාණය වර්ග කිලෝමීටර් දෙකක් පමණක් වන හෙයිනි. ඔහුගේ යටතේ සිටි වගකිවයුත්තන් ට දඬුවම් කළ බව හෝ එම ප්‍රහාර වලක්වන්නට ප්‍රමාණවත් තරමේ සියලු පියවර ගත් බව හෝ දැනගන්නට නැත.

**භාරවීම්**

වට්ටුවාක්කල් පාලමේ දී පුද්ගලයන් භාර වූයේ 58 සේනාංකයට බව එක්සත් ජාතීන්ගේ වාර්තාව සඳහන් කරයි. එම ප්‍රදේශයේ සමස්ත විධාන වගකීම තමන් යටතේ පැවති බව ප්‍රකාශ කර ඇති මේජර් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා, ඔහු වෙත භාරවූ එල්ටීටීඊ දේශපාලන නායකයන් ට පුද්ගලිකවම අතට අත දුන් බව සිද්ධිය සියැසින් දුටු අයකු ITJP වෙත ලබා දුන් සම්මුඛ සාකච්ඡාවකින් තහවුරු කර ඇත. මදක් කල් ගතවූ පසු ඔවුන්ගේ මළ සිරුරු වට්ටුවාක්කල් පාලමේ අනික් පැත්තේ මහමග තිබී දැක ගන්නට ලැබුනි. භාරවූවන් අතුරුදහන් කරවීමටත්, ඇතැමකු නඩු නොඅසා ඝාතනය කිරීමටත්, තම වගකීම යටතේ වූ හට පිරිස් වගකිව යුතුයැයි මේජර් ජෙනරාල් සිල්වා දැන සිටි බව හෝ ඒ පිළිබඳව ලැබුනු තොරතුරු දැනුවත්ව නොතකා හල බව හෝ විශ්වාස කළ හැකි සාධාරණ හේතු කාරණා පවතී.

**ලිංගික දූෂණය ඇතුළු ලිංගික ප්‍රචණ්ඩතා සහ වධබන්ධන**

වධහිංසාවට ගොදුරු වී ඇති එක් සාක්ෂිකරුවකු පැවසූ පරිදි මේජර් ජෙනරාල් සිල්වා වධහිංසාව අනුමත කළ අයෙකි. තම විධානය යටතේ සිටි හට පිරිස් විසින් වධහිංසා පැමිණවීම පිළිබඳව ශවේන්ද්‍ර සිල්වා දැන සිටි බව හෝ දැනගත යුතුව තිබුනු බවටද, එම කෙලෙසීම් වලක්වා ඊට වගකිවයුත්තන්ට දඬුවම් පැමිණවීමට පියවර නොගත් බවටද විශ්වාස කළ හැකි සාධාරණ හේතු කාරණා පවතී. මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස් කාර්යාලයේ වාර්තාවෙන් දැක්වෙන කරුණු වලින් ද, මේ වාර්තාවේ එන සාක්ෂි අනුව ද ලිංගික දූෂණය, වධහිංසාව සහ පුද්ගලික ගෞරවයට එරෙහි සාහසිකත්වය යනාදී යුද අපරාධ සම්බන්ධයෙන් මෙන්ම, සිය අණසක යටතේ පැවති හට පිරිස් විසින් කරන ලද වධහිංසා සම්බන්ධයෙන් වෙනමත් ද, මේජර් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ට නඩු පැවරිය හැකිය. නඩු පැවරිය යුතුය.

INTERNATIONAL
TRUTH
AND JUSTICE
PROJECT